**සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024**

-------------------------------------------------------------------------------------------------

සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2023 සහ 2024 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම**<br>**රු.** |
|---|---|
| වත්කම් | |
| ජංගම නොවන වත්කම් | 159,335 |
| ජංගම වත්කම් | 1,270,963,958 |
| මුළු වත්කම් | 1,271,123,293 |

| | |
|---|---|
| ස්කන්ධය හා වගකීම් | |
| ස්කන්ධය | 1,269,478,244 |
| වගකීම් | |
| මුළු බැරකම් | 1,645,050 |
| මුළු ස්කන්ධය හා බැරකම් | 1,271,123,293 |
| මුළු ආදායම | 1,947,462 |
| මුළු වියදම | 14,409,181 |
| ඌනතාවය | (12,461,719) |

## 3 සමාගම ඈවර කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් රු. මිලියන 200 ක (සාමාන්‍ය කොටස් 20,000,007ක) මූලික ආයෝජනයකින් සහ රු. මිලියන 10 ක ණය මුදලකින් සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් නමින් සමාගමක් පිහිටුවීමට අරමුදලේ භාරකාර මණ්ඩලය 2003 පෙබරවාරි 05 දින අනුමැතිය ලබාදී තිබුණු අතර ඒ අනුව අරමුදලේ පරිපාලිත සමාගමක් වන සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම 2003 ජූනි මස 23 වන දින සීමාසහිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි. අරමුදල විසින් මෙම සමාගම සමග 2003 නොවැම්බර් 18 දින එළඹි ගිවිසුමට අනුව අරමුදල සතු රු.මිලියන 3,160.7 ක් වූ අරමුදල් කළඹ කළමනාකරණය කිරීම මෙම සමාගමට පවරා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට අරමුදල විසින් සමාගමෙහි කොටස් 98,550,007 ක රු.985,500,070 ක් ආයෝජනය කර තිබුණි. සමාගම විසින් 2012 – 2017 කාලපරිච්ඡේදය තුළ සුරැකුම්පත් ගනුදෙනු තුළින් ප්‍රමාණවත් ලාභ ලබා නොතිබූ අතර සැලකිය යුතු අලාභයක් ලබා තිබුණි. | නැට්වෙල්ත් සිකුරිටි සමාගම විසින් මූල්‍ය වංචාවකට අදාල පැමිණිලි 2 ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති බැවින් එම නඩු අවසන් වන තෙක් සමාගම් ඈවර කිරීම ප්‍රමාද වී ඇත. තවද නැට්වෙල්ත් සිකුරිටි සමාගමේ රු. මිලියන 850 ක අරමුදල 2022 වර්ෂයේදි ගිවිසුමක් මගින් මහපොල අරමුදලට මාරු කොට ඇත. මෙම ගනුදෙනු පිළිබඳ අවසන් ශේෂ තහවුරු කිරීම මහපොල අරමුදල විසින් සිදුකොට නැති අතර ඒ අනුව 2023 හා 2024 අවසන් ගිණුම් පිළියෙළ කිරීම ප්‍රමාද වී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගමේ කොටස් ප්‍රාග්ධනය අඩුකිරීමට යෝජනා කර ඇති අතර එහි අවසන් තීරණය මහපොල අරමුදලේ අනුමැතිය සඳහා යොමුකර ඇත. එම අනුමැතිය ලද වහාම කොටස් ප්‍රාග්ධනය අඩුකර ඈවරකරුවෙකු පත්කිරීම හෝ කොටස් සුදුසු ආයෝජකයකුට පැවරීමට සමාගම කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

මේ හේතුවෙන්, 2018 අගෝස්තු 28 වන දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාගම ඈවර කිරීම මහ බැංකුවේ අනුමැතියට යටත්ව සිදුකළ යුතු බවට තීරණය කර තිබූ අතර 2021 මාර්තු 02 දිනැති අංක අමප/21/0269/313/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් එය තහවුරු කර තිබුණි. එසේ වුවද 2025 ඔක්තෝබර් 31 දින වන විටත් ඈවරකරුවෙකු පත්කර නොතිබුණ අතර ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

**04 ගිණුම් පොත්පත් හා ලේඛන ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ 2024 වර්ෂයට අදාළ මුදල් පොත, ලෙජර් ගිණුම්, බැංකු සැසඳුම් ප්‍රකාශන, බැංකු ශේෂ සනාථන ලිපි හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේ ගිණුම් ආරම්භ කර නොමැති බැවින් මුදල් පොත හා පොදු ලෙජරය අවසන් කර නැත. මුදල් පොත තුලනය කර බැංකු සැසඳුම් ප්‍රකාශන ගණකාධිකාරි ආයතනය මඟින් සිදුකරන අතර එය අවසන් වූ පසු විගණනයට ඉදිරිපත් කළ හැකියි. | මූල්‍ය වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණය සතුය. ගිණුම් සකස් කිරීම සඳහා ගණකාධිකාරි ආයතනයක සහය ලබා ගැනීම ආයතනයේ අභ්‍යන්තර කාර්යයකි. අදාළ මූල්‍ය වාර්තා නිසි පරිදි සකස්කර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |